# කොළඹ දිසා අධිකරණයේදී ය.

කොළඹ ලෝටර්ස් පාරේ, එච්ලන් චතුරශ්‍රයේ, අංක.55, කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය භාරේ හොටේල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම පිළිබඳව වන කාරණය සම්බන්ධයෙන්,

සහ

නඩු අංකය : 217/සී.ඕ.

1982 අංක.18 දරණ සමාගම් පනතේ IX කොටස යටතේ අධිකරණය විසින් ඈවර කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව වන කාරණය සම්බන්ධයෙන්,

නිහාල් ශ්‍රී අමරසේකර
අංක.167/4, විපුලසේන මාවත,
කොළඹ 10.

පෙත්සම්කරු.

වර්ෂ 2012 ක්වූ මැයි මස 23 වන දිනදී ය.

ස්වකීය නීතිඥවරුන් වන වී.ඩබ්ලිව්.කුලරත්න අසෝෂියේට්ස් යන නාමය, විලාසය සහ අභිධානය යටතේ නීතිඥ වෘත්තියෙහි යෙදී සිටින නීතිඥ යමුනා බාලසූරිය සහ නීතිඥ විජයලක්ෂ්මී දීපානි නිරෝෂිනී විජේසේකර මඟින් පෙනී සිටින ඉහත නම් සඳහන් *පෙත්සම්කරුගේ විරෝධතා ප්‍රකාශනයෙන්* මෙසේ කියා සිටියි.

1. ඔබ උතුමාණන්ගේ ගරු අධිකරණයේ නියමය ප්‍රකාර, මෙම විරෝධතාවයන් වන්නේ, රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා විසින් 2012.03.15 වන දින ඉදිරිපත් කරනු ලැබූ මෝසම්පත් දෙක කෙරෙහි ය.

2. එම මෝසම්පත් දෙක, ඔබ උතුමාණන්ගේ අධිකරණයෙන් නියෝගයක් ලබා ගැනීම සඳහා කර ඇති නීත්‍යානුකූල ඉල්ලීම් වශයෙන් ස්ථාපනය වන්නේවත් පිළිගත හැකිවන්නේවත් නැති වන අතර, ඒ අනුව මුල් අවස්ථාවේදීම (in limine) ඒවා ප්‍රතික්ෂේප කළ යුතු වන්නේ ය.

3. මෙම ගණන් බේරා වසා දැමීමේ නීති කෘතීන් 2006.11.17 වන දින ආරම්භවීම පටන්ම, මෙහි දක්වා ඇති අදාළ සිද්ධිමය කාරණා සහ නීතිය අතික්‍රමණය කිරීම් එකී මෝසම් පත් දෙක යටපත් කොට ඇත.

4. ගරු ඔබතුමාණන්ගේ අධිකරණයෙන් නියෝගයක් ඉල්ලා සිටිමෙහිලා, නීත්‍යානුකූල ඉල්ලීමක්, දිවුරුම් ප්‍රකාශයකින් තහවුරු කෙරුනු පෙත්සමක් මඟින් විය යුතුය.

5. මෙම ගණන් බේරා වසා දැමීමේ නීති කෘතියට විෂය වස්තුව වන සමාගමේ කොටස් හිමියකු වශයෙන්, පෙත්සම්කරු විසින් 2006.11.17 වන දින සිය පෙත්සම ඉදිරිපත් කර සිටින ලදී.

6. එසේ බැවින්, මෙම ගණන් බේරා වසා දැමීමේ නීති කෘතියෙහි අයිතිවාසිකම් පෙත්සම්කරුගේ කොටස් හිමිකමට ආරෝපණය වී ඇත.

7. ඉහත කී මෝසම්පත් දෙකෙහි ප්‍රකාශ කර ඇති අයුරින්, පෙත්සම්කරුගේ කොටස් නිසි බලධාරියා වෙත පැවරී නොමැත.

8. 2007 අංක.7 දරණ සමාගම් පනතේ 277 වගන්තියේ නියමයන් අනුව, ගණන් බේරා වසා දැමීමේ පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ වේලාවෙහි, එනම් මෙහිදී 2006.11.17 දින, සමාගම ගණන් බේරා වසා දැමීම ආරම්භ වූ ලෙස සලකනු ලැබිය යුතුය.

9. සමාගම, 2007 අංක.7 දරණ සමාගම් පනතේ විධිවිධානයන් මඟින් පාලනය වනු ලබන පොදු සමාගමක් ලෙසට දිගටම තවමත් පවති.

10. රජය විසින් සමාගමට අත්තිකාරම් කරන ලද ණය මුදල් වල මුල් මුදල් ප්‍රමාණය රු.435,986,893/- කට ගණනය වී තිබුණි.

| ණය මුදලේ දිනය | මුදල (රු.) | පොළී අනුපාතය |
|---|---|---|
| 97.07.01 | 288,567,631 | 12.50% |
| 99.07.07 | 469,742,070 | 12.50% |
| 00.07.03 | 464,427,826 | 12.50% |
| 01.07.03 | 360,618,876 | 18.56% |
| 02.07.03 | 446,803,874 | 12.50% |
| 03.07.01 | 340,024,378 | 9.40% |
| 04.07.01 | 395,658,959 | 8.59% |
| 05.06.30 | 225,639,338 | 10.28% |
| 06.06.30 | 157,555,617 | 11.61% |
| 07.06.30 | 344,772,738 | 18.77% |
| 08.06.30 | 456,077,609 | 20.59% |
| 10.12.28 | 486,097,977 | 8.39% |
| එකතුව | 4,435,986,893 | |

11. 2010.03.31 දිනට සමාගමේ ඉහත කී ශේෂ පත්‍රයට ඉහත සඳහන් අනුපාතයට පොලී, වාර්ෂිකව සංයෝජනය කරමින් ඇතුලත් කර ඇත.

12. රු.12,098,634,769/77 ක ප්‍රමාණයක මුදලක් ඉල්ලුම් කරමින් සමාගමට අත්තිකාරම් කර තිබු ණය මුදල් ආපසු ගෙවා සිටින ලෙසට 2011.05.03 දිනැති ලිපියෙන් රජය විසින් සමාගමට අවශ්‍ය කර ඇත.

13. පොළී මුදල් මුල් මුදල ඉක්මවා නොයායුතු බව සිවිල් නීති ආඥා පනතේ 5 වන වගන්තියේ විධානාත්මක කොට ඇත.

14. 2007 අංක.7 දරණ සමාගම් පනතේ 277 වගන්තිය සමඟ කියවෙන 364 වගන්තියේ නියමිතයන් අනුව,2006.11.17 දින සමාගම ගණන් බේරා වසා දැමීමට පෙත්සම ඉදිරිපත් කර සිටිමෙන් අනතුරුව, කිසිදු පොලියක් සමාගම විසින් ගෙවියයුතු වන්නේවත්, සමාගමෙන් අයකරගත හැකි වන්නේවත් නැත.

15. 2007.05.03 දින බලාත්මකභාවයට පත්වුන 2007 අංක.7 දරණ සමාගම් පනතේ 219 වගන්තිය සමාගම ගණන් බේරා වසා දැමීම විධානාත්මක කළ අතර සමාගමේ ණය සඳහා අධ්‍යක්ෂකවරුන් පුද්ගලිකවම වගකීමකට ලක් කළේ ය.

16. ණය මුදල් ආපසු ගෙවීමට සමාගමට සම්පත් නොමැති බව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007.01.21 වන දින දරණ කැබිනට් මණ්ඩල සංදේශයෙහි 2 වන ජේදයේ දක්වා ඇත.

17. ඊට අමතරව 2007 අංක.7 දරණ සමාගම් පනතේ 375 වගන්තිය අධ්‍යක්ෂකකවරුන් පුද්ගලිකවම සමාගමක ණය සඳහා වගකිව යුතු බවට පත් කරමින්, සමාගමක් විසින් වංචනික වෙළඳාමේ යෙදීම තහනම් කොට ඇත.

18. සමාගමක කොටස් ප්‍රාග්ධනයේ 50% ක්ම ක්ෂය වී කිදාබැස ඇති අවස්ථාවකදී, 2007 අංක. 7 දරණ සමාගම් පනතේ 220 වගන්තියේ නියමයන්ට අනුව, වෙනත් දේ අතර පාඩුවල ප්‍රමාණය ඒ සඳහා හේතු සහ පාඩු පියවීම සඳහා ගනු ලබන පියවර පිළිබඳව කරුණු පැහැදිලි කිරිම සඳහා අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට අධ්‍යක්ෂකකවරුන් කර්යභාරයෙහිලා බැඳී සිටිනු ලැබේ.

19. සමාගම ගත් කල්හි, එහි සමස්ථ කොටස් ප්‍රාග්ධනයට ක්ෂය වී කිදාබැස ගොස් ඇති නමුදු එසේ වුවද, 2007 අංක.7 දරණ සමාගම් පනතේ 220 වගන්තියේ විධානාත්මක විධිවිධානයන් ඉටු කිරිමට අධ්‍යක්ෂකවරුන් අසමත් වී ඇත.

20. අධිකරණය විසින් කරනු ලබන ගණන් බේරා වසා දැමීමකදී, ගණන් බේරා වසා දැමීම ආරම්භ වීමෙන් පසුව, මේ අවස්ථාවේ දී ආරම්භ වූ දිනය වන 2006.11.17 දිනෙන් පසුව, අධිකරණය විසින් අන්‍යාකාරයකින් ආඥා කරන්නේ නම් මිස, කරනු ලැබූ සමාගමේ දේපළක නියාදනයක් හෝ කොටස් පැවරීමක් හෝ වෙනස් කිරීමක් ශුන්‍යවිය යුතු බවට 2007 අංක.7 දරණ සමාගම් පනතේ 225 වගන්තිය විධානාමත්මක කර ඇත.

21. 2007 අංක.7 දරණ සමාගම් පනතේ 187 සිට 190 දක්වා වගන්ති "අධ්‍යක්ෂකවරුන්ගේ යුතුකම්" නියමිතව දක්වා ඇති අතර එහි 188 වගන්තිය මගින්, සමාගම් පනතේ මොනයම් හෝ විධිවිධානයක් හෝ උල්ලංඝනය කරමින් ක්‍රියා කිරීමෙන් හෝ ක්‍රියා කිරීමට එකඟ වීමෙන් අධ්‍යක්ෂකවරයෙකු තහනම් කොට ඇත.

22. එසේ බැවින්, සමාගමේ කළමනාකරණ පාලනය ක්‍රියාත්මක කළ රජයේ අධ්‍යක්ෂකවරුන් 2007 අංක.7 දරණ සමාගම් පනත බරපතල ලෙස උල්ලංඝණය කරමින් ක්‍රියා කොට ඇති අතර, රජයට හෝ වේවා අන් කවරෙකුට හෝ වේවා, රජය නම් මහජනයාට, සමාගමේ ණය සඳහා ඔවුන් පුද්ගලිකව වගකීම දැරිය යුතුය.

23. 2006.11.17 දින සමාගම පනතේ ගණන් බේරා වසා දැමීම සඳහා පෙත්සම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රජය විසින් පත් කරනු ලැබ නිළ දැරූ, රජයේ 64% ක කොටස් හිමිකමකින් යුතු සමාගමේ කළමනාකරණ පාලනයේ නිරතවුන අධ්‍යක්ෂකවරුන් මෙසේ ය.

| | | |
|---|---|---|
| ටී.නඩේසන් | - | සභාපති ( 2010.05.12 සිට ) |
| එන්.රාජබ්දීන් | - | සභාපති 2010.05.21 ඉල්ලා අස්විය. |
| වී.කනගසභාපති | | |
| කේ.වී.එන්. ජයවර්ධන | | |
| ටී.වික්‍රමසූරිය | | |
| එන්.වරුසවිතාරණ | | |
| කේ.වික්‍රමනායක | | |

24. සමාගම පාලනය කළ රජයේ නාමික අධ්‍යක්ෂකවරුන් විසින්ම රටෙහි ව්‍යවස්ථාපිත නීතිය ප්‍රකට ලෙසට උල්ලංඝනය කර තිබීම නියත ලෙසින්ම ත්‍රස්තජනකය.

25. ඉහත කී 2012.03.15 දිනැති මෝසම්පත් දෙක ඉදිරිපත් කර ඇත්තේ ඉහත කී අයුතු ක්‍රියා සහ 2007 අංක.7 දරණ සමාගම් පනත උල්ලංඝනය කිරීම් මෙම ගණන් බේරා වසා දැමීමේ නීති කෘතියෙන් හෙළිදරව් වීම හිතාමතා හොර රහසේම වසන් කිරීමේ චේතනාවෙනි.

26. ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරුන්ගේ කල්ක්‍රියාව සහ නීතිඥවරුන් සඳහා ආචාර සමාචාර විධි රීතිහි 11 වන රීතියේ නියමයන් අනුව වරදක් සිදු කිරීමට හෝ වරදක් සිදු කිරීමට අනුබල දීමකට ඔහු නියැලෙනු ඇති යම් වෘත්තීමය කාරණයක් භාර ගැනීමෙන් නීතිඥවරයෙකු තහනම් කොට ඇත.

27. රජය විසින් සමාගමෙන් කර ඇති පූර්වෝක්ත රුපියල් මිලියන 12099 ක අතිරික්ත සහ/හෝ නීතිවිරෝධී ඉල්ලීම සසදා බැලිමෙහිලා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් සහ නීතිපතිවරයාගෙන් ද ඇතුළුව අවහිරතා සහ පීඩනයන් මාධ්‍යයේ, රාජ්‍ය ඇපකරයන් යටතේ සමාගමෙන් කර තිබූ ඉල්ලීම් මත, පෙත්සම්කරුගේ නොපසුබට තත් උත්සාහයන් මඟින් ලබාගත් කපා හැරීම එවකට ශ්‍රී ලංකා රුපියල් මිලියන 10,200 කට සමාන වුන එක්සත් ජනපද ඩොලර් මිලියන 207 කට ගණනය වුන අතර (ඉහත කී පරිදි රජය විසින් අයකරනු ලබන සාමාන්‍ය පොලිය මත) වසරකට 13% බැගින් පොලියක් මත එය 2011 මැයි වන විට රුපියල් මිලියන 70,703 කට ගණනය වනු ඇත.

28. මෙහි සම්ප්‍රකාශයන් තහවුරු කරමින් පෙත්සම්කරුගේ දිවුරුම් ප්‍රකාශය අමුණා ඇත.

***එබැවින් පෙත්සම්කරු ගරු ඔබතුමාණන්ගේ අධිකරණයෙන් ගෞරව පූර්වකව අයැද සිටිනු ලබන්නේ,***

a) රාජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා විසින් 2012.03.12 වන දින ඉදිරිපත් කරන ලද මෝසම්පත් දෙක මුල් ආරම්භයේදීම (in liminie) ප්‍රතික්ෂේප කරන ලෙසට අණ කරමින්;

b) පෙත්සම්කරු විසින් ගණන් බේරා වසා දැමීමේ පෙත්සම ඉදිරිපත් කිරීමෙන් 2007 අංක.7 දරණ සමාගම් පනතේ 277 වගන්තිය ප්‍රකාර, සමාගමේ ගණන් බේරා වසා දැමීමේ කාර්ය 2006.11.17 දින ආරම්භ වුන බවට ප්‍රකාශ කරමින්;

c) සමාගම 2007 අංක.7 දරණ සමාගම් පනතේ විධිවිධානයන් මඟින් පාලනය වන බවත්, එහි විධිවිධානයන් ඉටු කිරීමට එය නීතියෙහිලා බැඳී සිටිනු ලබන බවත් ප්‍රකාශ කරමින්;

d) 2007 අංක.7 දරණ සමාගම් පනතේ 275 වගන්තියේ නියමයන් ප්‍රකාර, සමාගම් ණය මුදල් සමාගමේ කොටස් ප්‍රාග්ධනයට කරනු ලබන යම් පරිවර්ථනයක් ශූන්‍ය වන බවට ප්‍රකාශ කරමින්;

e) මෙම විරෝධතා ප්‍රකාශයේ 22 වන ඡේදයේ සඳහන් සමාගමේ අධ්‍යක්ෂකවරුන් 2007 අංක.7 දරණ සමාගම් පනතේ විධිවිධානයන් උල්ලංඝනය කරමින් ක්‍රියාකර ඇති බවට ප්‍රකාශ කරමින්;

f) සමාගමේ අධ්‍යක්ෂකවරුන්, සමාගමේ හෝ අන් කිසිදු සෙසු සමාගමක අධ්‍යක්ෂකවරුන් වශයෙන් නිළ දැරීමට සුදුසු සහ නිසි පුද්ගයන් නොවන බව ප්‍රකාශ කරමින්;

g) මෙම විරෝධතා ප්‍රකාශය 22 ඡේදයේ සඳහන් අධ්‍යක්ෂකවරුන් මෙම ගණන් බේරා වසා දැමීමේ නීති කෘතිය ආරම්භ වුන දින වන 2006.11.17 වන දිනට සමාගමේ වත්කම්වලට අතිරික්තව වුන සමාගමේ ණය මුදල් සඳහා සාමුහිකව සහ වෙන් වෙන් වශයෙන් වගකිවයුතු බවට ප්‍රකාශ කරමින්;

h) මෙම ගණන් බේරා වසා දැමීමේ නීති කෘතිය ආරම්භ වුන දින වන 2006.11.17 වන දිනට සමාගමේ වත්කම්වලට අතිරික්තව වුන සමාගමේ ණය මුදල් මෙම විරෝධතා ප්‍රකාශයේ 22 වන ඡේදයේ සඳහන් අධ්‍යක්ෂකවරුන්ගෙන් අයකර ගැනිමට අණ කරමින්;

i) 2006.11.17 දින ගණන් බේරා වසා දැමීම ආරම්භවීමෙන් අනතුරුව සමාගම විසින් ගෙවන ලද සහ/හෝ දරණ ලද පොළී, මෙම විරෝධතා ප්‍රකාශයේ 22 වන ඡේදයේ සඳහන් අධ්‍යක්ෂකවරුන්ගෙන් අයකර ගැනිමට අණ කරමින්;

j) ඉහත (g), (h) සහ (i) ආයාචනයන් හි සඳහන් මූල්‍යමය ගණන් ප්‍රමාණයක් ගරු ඔබතුමාණන්ගේ අධිකරණයට එළිදරව් කර සිටින ලෙසට අණ කරමින්;

k) නඩු ගාස්තු ප්‍රදානය කරමින් සහ

l) ගරු අධිකරණයට සුදුසු යයි හැඟීයන වෙනත් එවැනි සහ වැඩිදුර සහනයන් ප්‍රදානය කරමින්

කාරණිකව නියෝගයක් කරන ලෙස ය.

V W Kularatne Associates

පෙත්සම්කරුගේ නීතිඥවරුන්.